# ගිණුම්කරණය හැඳින්වීම

ලූකා පැසියෝලිගේ දෙවන පරපුර ...

**ගයාන් දිලීප**

**0 3**

1. ඕනෑම ව්‍යාපාරයක ගිණුම්කරණය මගින් දත්ත තොරතුරු බවට පරිවර්ථනය කර තීරණ ගන්නා පාර්ශවයන්ට තීරණ ගැණීමේ කාර්ය සඳහා ලබා දේ. මෙලෙස ගිණුම්කරණය මගින් ව්‍යාපාරයක් බලාපොරොත්තු වන්නේ,

   I. සියළුම ගනුදෙනු ගිණුම් පොත්වල වාර්ථා කිරීමයි.
   II. කළමණාකරණය සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමයි.
   III. ආයතනයේ ශුද්ධ ලාභය ගණනය කිරීමයි.
   IV. තොරතුරු භාවිතා කරන පාර්ශවයන්ට තීරණ ගැණීමට වැදගත් තොරතුරු ලබාදීමයි.
   V. ව්‍යාපාරයේ වංචා වලක්වා ගැණීම.

2. රජය විසින් භාණ්ඩ හා සේව මත **VAT** ප්‍රතිශතය 12% සිට 15% දක්වා වැඩිකිරීම නිසා ව්‍යාපාරයේ විකුණුම් අඩු වේ.මෙම බලපෑම ඇතිවූ පරිසර සාධකය වන්නේ,

   I. නෛතික පරිසරය
   II. ආර්ථික හා දේශපාලන පරිසරය
   III. තාක්‍ෂණික පරිසරය
   IV. සමාජ හා සංස්කෘතික පරිසරය
   V. ශිල්පීය හා වෘර්ථීය පරිසරය

3. ව්‍යාපාරයක ගිණුම්කරණයට බලපෑම් කරන භාහිර පරිසර සාධකයන් ඇතුලත් කාණ්ඩය වන්නේ,

   I. ආර්ථික හා දේශපාලන / තාක්‍ෂණික / ශිල්පීය හා වෘර්ථීය / තොරතුරු තාක්‍ෂණික
   II. ආර්ථික සංස්කෘතික / සමාජ සංස්කෘතික / තාක්‍ෂණික / ආර්ථික හා දේශපාලන
   III. සමාජ හා සංස්කෘතික / ආර්ථික හා දේශපාලන / ශිල්පීය හා වෘර්ථීය / තාක්‍ෂණික
   IV. තොරතුරු තාක්‍ෂණික / ක්‍රියාවලිය / පාලන පද්ධතිය / ආයතනික සංස්කෘතිය
   V. තාක්‍ෂණික / ශිල්පීය හා වෘර්ථීය / තොරතුරු තාක්‍ෂණික / ආයතනික සංස්කෘතිය

4. පහත ගිණුම්කරණ සමීකරණ අතුරින් කුමන සමීකරණ නිවැරදි වන්නේ ද ?.

A. ශුද්ධ වත්කම් = හිමිකම්

B. වත්කම් + වියදම් = හිමිකම් + ආදායම් + වගකීම්

C. වත්කම් + ආදායම් = හිමිකම් + වියදම් + වගකීම්

D. ශුද්ධ වත්කම් = මුළු වත්කම් - ජංගම නොවන වගකීම් - ජංගම වගකීම්

I. A,B හා D පමණි. III. B හා D පමණි. V. B පමණි.

II. A,B හා C පමණි. IV. B,C හා D පමණි.

5. ව්‍යාපාරයක ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා යොදාගතහැකි සමීකරණයනම්,

I. ආරම්භක ශුද්ධ වත්කම් - අවසාන ශුද්ධ වත්කම් - අමතර ප්‍රාග්ධනය + ගැණිලි

II. අවසාන වත්කම් - ආරම්භක වත්කම් - අමතර ප්‍රාග්ධනය + ගැණිලි

III. අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් + අමතර ප්‍රාග්ධනය - ගැණිලි

IV. අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් - අමතර ප්‍රාග්ධනය + ගැණිලි

V. ඉහත කිසිවක් නිවැරදි නොවේ.

**පහත තොරතුරු භාවිතා කරමින් ප්‍රශ්න අංක 6 සහ 9 සඳහා පිළිතුරු සපයන්න.**

සිසිර විසින් ජානකට ලකුණුකල මිල රු. 800,000 වූ තොගයක් පිරිවැයට 10% වෙළඳ වට්ටමකට යටත්ව අලෙවි කරන ලදි. මෙම තොගයෙන් රු. 120,000 වටිනාකමක් සහිත තොගයක් දෝශ පැවති නිසා ජානක විසින් සිසිරට ආපසු යවන ලදි. මුදල් ගෙවීමේදී මාසයක් ඇතුලත රු. 500,000 ශේෂයක් පියවීමට 5% වට්ටමකට යටත්ව සිසිරට මුදල් ලැබුණි.

6. ඉහත ගනුදෙනු ජානකගේ ව්‍යාපාරයේ ගිණුම් පොත්වල වාර්ථා කිරීමට අදාල මුලික පොත් දක්වන්න.

I. විකුණුම් ජර්නලය, ආපසු එවුම් ජර්නලය, ලැබීම් මුදල් ජර්නලය, පොදු ජර්නලය.

II. ගැණුම් ජර්නලය, පොදු ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය, ආපසු එවුම් ජර්නලය

III. විකුණුම් ජර්නලය, ආපසු යැවුම් ජර්නලය, ගෙවීම් මුදල් ජර්නලය, පොදු ජර්නලය.

IV. ගැණුම් ජර්නලය, ආපසු යැවුම් ජර්නලය, ගෙවීම් මුදල් ජර්නලය, ගෙවීම් මුදල් ජර්නලය.

V. පොදු ජර්නලය, ගැණුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය, පොදු ජර්නලය

7. මෙම ගනුදෙනු සිසිරගේ ව්‍යාපාරයේ ගිණුම් පොත්වල වාර්තා කිරිමට අදාල මූලාශ්‍ර ලේඛණ පිළිවලින් දැක්වෙනුයේ.

   I. ඉන්වොයිසිය, හරපත, ලදුපත
   II. ඉන්වොයිසිය, බැරපත, ලදුපත
   III. ජර්නල් වවුචරය, හරපත, ලදුපත
   IV. ජර්නල් වවුචරය, හරපත, පිළිපත
   V. ඉහත කිසිවක් නොවේ.

8. ඉහත ගනුදෙනුව ජානකගේ ව්‍යාපාරයේ සහ සිසිරගේ ව්‍යාපාරයේ වෙළඳ වට්ටම් අඩුකලපසු අගය වාර්ථා කිරීමට මග පෙන්වන නිවැරදි ගිණුම්කරන සංකල්පය දක්වන්න.

   I. ගිණුම්කරන ඒකක සංකල්පය.
   II. මූල්‍ය මිණුම් සංකල්පය.
   III. ඓතිහාසික පිරිවැය සංකල්පය.
   IV. අඛණ්ඩ පැවැතිම පිළිබද සංකල්පය.
   V. ද්විත්ව රූප සංකල්පය.

9. ඉහත ගනුදෙනුව මුලික ගිණුම්කරණ සමීකරණයට ගැලපීමෙන් පසු නිවැරදි සමිකරණය ඇතුලත් වන්නේ,

   වත්කම් = හිමිකම් + වගකීම්

   ..........................................................................................

   ..........................................................................................

10. ආයතනයක් ගිනුම් තැබිමේ දී යොදාගන්නා මුලික ගිණුම්කරණ උපකල්පව වන්නේ,

   I. මූල්‍ය මිණුම් සංකල්පය, ඒකක සංකල්පය
   II. අදාල බව, විශ්වාසනියත්වය.
   III. ආදායම් , වියදම්
   IV. උපචිත සංකල්පය, අඛණ්ඩ පැවැත්ම
   V. මුල්‍ය ගිණුම්කරණය, කළමණාකරන ගිණුම්කරණය


**2020 - සිද්ධාන්ත පංති**

**2019 - පුනරීක්ෂණ පංති**

**071 - 2616609**